ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2034/8 - 2017 අගෝස්තු මස 28 වැනි සඳුදා - 2017.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට දියතලාව ජල සම්පාදන ක්‍රමයේ දෙඩන්වත්ත ජල ටැංකිය ඉදිකර ඇති ඉඩම් කොටසේ අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අගෝස්තු මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1268

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, හපුතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 63G , දෙඩන්වත්ත ග්‍රාම නිලධාරී වසමේ දෙඩන්වත්ත ගමේ පිහිටි අම්බලන්කපොල්ල වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 4ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම්. එම්. වික්‍රමසිංහ මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ඩී. එම්. කරුණාරත්න මහතා හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | ඩී. එම්. කරුණාරත්න මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | දියතලාව - කහගොල්ල පාර (දෙඩන්වත්ත පාර) |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ඩී. ඩී. චිත්‍රා ශ්‍යාමලී මිය,
ඉනිෂනන් ගාර්ඩන් සිටි,
දියතලාව.

09-267

1A - G 26168— 29 (2017/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

LAND/MP/2559

## ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/09 හා 2015.12.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 4A පිටුවේ ප්‍රකාශයට පත් කරන ලද නියමයේ උපලේඛනයේ ඉඩමේ නම දූල්තොට සොහොන් කනත්ත පතන යනුවෙන් සඳහන් කර ඇතත්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අංක B/ACQ/HLD/2016/345 පුගමණ අනුරේඛනයෙහි සඳහන් පරිදි ඇටකෙහෙල් ඇල්ලේ පතන හා දෙඩංහේන දුඹුල්ගහ තැන්නෙ හේන යනුවෙන් ද, ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 1.0976 වශයෙන් ද නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 අගෝස්තු මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1153

09-268